**පානදුර නගර සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

**--------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**--------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුලි 25 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 23 දින ද සභාපතිවරයාට යවා ඇත**.**

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පානදුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ---------------------- |
| (i) | සෞඛ්‍ය සේවා වැඩසටහනේ බලපත්‍ර ගාස්තු ආදායම රු.86,050 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාලව පොදු පරිපාලන හා භෞතික සැලසුම් වැඩසටහන්වලට අදාල උපකරණ වැය රු.177,926 ක් අඩුවෙන් හා පොදු ගබඩා රු.177,926 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (iii) | නැණසල මධ්‍යස්ථානය වෙනුවෙන් පවත්වාගෙන යන ඉතිරි කිරීමේ ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට රු.1,286,130 ක ශේෂය සහ 2018 වර්ෂයේ උපයාගත් රු.172,496 ක් වූ ආදායම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණ අතර පෙර වර්ෂයන්ට අදාල ආදායම වූ රු.1,123,638 ක මුදල සම්මුච්චිත අරමුදල් | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | ගිණුමට ගලපා නොතිබුණි. | | |
| (iv) | සභික දීමනා හා ලැබිය යුතු සභික දීමනා රු.285,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (v) | මුද්දර ගාස්තු ආදායමින් අඩුකර ගැනීමේ පදනම මත 2017 වර්ෂයේදී ලබා දී ඇති ට්‍රැක්ටර් සහ ට්‍රේලර් දෙකක වටිනාකම වූ රු.3,285,000 මුදල උපයෝගී සේවා ගිණුම හර කර පළාත් සභා ණය ගිණුමට බැරට සටහන් කලයුතු වුවත්, සම්මුච්චිත අරමුදල රු.3,285,000 හර කර ණය ගිණුම බැර කිරීම හේතුවෙන් සම්මුච්චිත අරමුදලේ ශේෂය රු.3,285,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | පලාත් පාලන දෙපාර්තමේන්තුව මගින් නිශ්චිත උපදෙස් ගිණුම් තැබීම සඳහා ලබාදී නොමැත. |
| (vi) | 2016 වර්ෂයේදී රු.2,955,000 ක් වැය කර ලබාගත් මෘදුකාංග පද්ධතිය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි ගිණුම්ගත කරමි. |
| (vii) | තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.8,326,666 ක් වූ පොත් අගය ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට තොග ශේෂය රු.1,005,933 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | වරද නිවැරදි කර ඇත. |
| (viii) | සමාලෝචිත වර්ෂයට ආදාල ස්ථාවර වත්කම් ශේෂය රු.60,184 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදිව ගිණුම් ගත කරමි. |
| (ix) | සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පත් ශේෂය රු.750,811 ක් වැඩියෙන් හා ස්ථාවර තැන්පත් පොලිය රු.96,084 ක් අඩුවෙන් දක්වා තිබුණි | නිවැරදි වටිනාකම ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදිව ගිණුම් ගත කරමි. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය , අත්තිකාරම් ලේඛනය , සේවක ණය උප ලේඛන හා සමීක්ෂණ මණ්ඩල වාර්තා නොමැතිවීම නිසා එකතුව රු.20,667,441 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරමි. |

1. 4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1988 නගර සහා ආඥා පනත 170 (2) වගන්තිය | | හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපල තහනම් කිරිම් කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනිමට කටයුතු කලයුතු අතර අවසන් පියවර ලෙස දේපල තහනම් කිරිමේ කටයුතු කළ යුතු වේ. | විනිශ්‍රහ බලපත්‍ර නිකුත් කිරිම මගින් හිඟ වරිපනම් බදු අය කිරිමට කටයුතු කරන බව හා ඉදිරියේදී දේපල තහනම් කිරිමේ කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 1,078,095 | කිසියම් කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් මුදලක් අදාල කාර්ය නිම වූ වහාම පියවිය යුතු වුවත් එසේ කර නොතිබුණි. | තත්කාර්ය අත්තිකාරම් අදාල කාර්ය නිම වූ වහාම පිය විය යුතුවේ. | අත්තිකාරම් ශේෂයෙන් රු.1,061,250 ක් වූ ශේෂය කපා හැරිම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කර ඇත. |
| (ඇ) | 2008 ජනවාරි 25 දිනැති අංක1533/16 දරන ගැසට් පත්‍රය | - | පරිසර ආරක්ෂණ බලපත්‍රවල කල් ඉකුත් වී තිබු ආයතන 03 ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත් කිරිමට හා ආයතන 09 ක් සඳහා අළුතින් බලපත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පරිසර බලපත්‍ර ලබා දිමට කටයුතු කරමින් පවති. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 434 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | වරිපනම් බදු තක්සේරුව වසර 05 කට වරක් සිදු කලයුතු වුවත්, අවසන් වරට සිදු කර තිබුණේ 2009 වර්ෂයේදීය. | පනත හා රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුවේ. | 2018 වර්ෂයේ සිට වරිපනම් බදු තක්සේරුවක් සිදු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.50,657,789 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.48,067,145 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 45,200,000 | 47,666,748 | 35,586,716 | 18,851,019 | 45,550,000 | 45,438,537 | 33,658,610 | 19,813,677 |
| (ii) | කුලී | 5,305,000 | 5,289,224 | 1,568,451 | 3,720,773 | 1,506,000 | 1,551,513 | 1,533,612 | 435,840 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 350,000 | 506,478 | 506,478 | - | - | 415,810 | 415,810 | - |
| (iv) | වෙනත් ආදායම් | 55,000,000 | 55,000,000 | - | 147,218,030 | 55,000,000 | 55,000,000 | - | 96,105,750 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟ ආදායම රු.19,659,311ක් වූ අතර | සියළුම හිඟ ආදායම අයකල යුතුවේ. | හිඟ ආදායමින් සියයට 14.29 ක් අයකර තිබුණි. |

2019 ජුනි 30 දින වන විට ඉන් රු.5,746,932 ක් හෙවත් සියයට 29 ක් අයකර නොතිබුණි.

| | | |
|---|---|---|
| (ii) වාර්ෂික බිල් කිරිම රු.44,784,787 ක් වූ අතර 2019 ජුනි 30 දින වන විට ඉන් රු.5,564,453 ක් හෙවත් සියයට 12 ක් අයකර ගෙන නොතිබුණි. | සියළුම හිඟ ආදායම අයකල යුතුවේ. | වරිපනම් බිල් කිරීමෙන් සියයට 12 ක් අයකර ගෙන නොමැත. |
| (iii) සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ වරිපනම් බදු හිඟය රු.18,719,584 ක් වූ අතර එම හිඟය 2019 ජුනි 30 වන විට රු.11,321,546 ක් විය. | සියළුම හිඟ ආදායම අයකල යුතුවේ. | 2019 ජුනි 30 වන විට රු.7,398,038 ක් අයකර ගෙන ඇත. |
| (iv) හිඟ වරිපනම් බදු කාල විශ්ලේෂණයට අනුව වසර 05 ඉක්ම වූ වරිපනම් බදු හිඟ ආදායම 2019 ජුනි 30 දින වන විට රු.4,199,438 ක් වූ අතර එම වටිනාකම මුළු වරිපනම් බදු හිඟයෙන් සියයට 37 ක් විය. | සියළුම හිඟ ආදායම අයකල යුතුවේ. | වරිපනම් අය කිරීමේ ප්‍රතිශතය සියයට 23.08 ක් විය. |

2.2.3 ව්‍යාපාර හා කර්මාන්ත බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ව්‍යාපාර හා කර්මාන්ත බදු ආදායම රු.82,590 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.65,840 ක් හෙවත් සියයට 80 ක් අයකර ගෙන නොතිබුණි. | සියළුම හිඟ ආදායම අයකල යුතුවේ. | හිඟ ආදායම අය කිරීමට කටයුතු කරමි. |

2.2.4 කඩකුලී ආදායම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතු කඩ කාමර 302 න් සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ කඩ කුලිය රු.435,840 ක් වූ අතර , වර්ෂය අවසාන වන විට ඉන් රු.386,577 ක් හෙවත් සියයට 88 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ කුලිය අයකර ගත යුතුවේ. | හිඟ කුලිය කපා හැරීමට සාධාරණීයකරණ වාර්තා සකස් කරමින් පවතී. |
| (ii) | දුම්රියපොළ පාර කඩ කාමර 22 ක් හා මාකට් පාර කඩ කාමර 22 ක් සඳහා | නව තක්සේරුව අනුව කුලී මුදල් අයකල යුතු | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී විමසීමට කටයුතු |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ නව තක්සේරුව අනුව බිල් කරන ලද ආදායම රු.4,968,000 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.3,720,773 ක් හෙවත් සියයට 75 අයකර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ හිඟ කඩ කුලිය රු.4,107,289 ක් විය. | වේ. | කර ඇති බවත් , උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරමි. |
| (iii) දුම්රියපොල පාර හා මාකට් පාර කඩ කාමර වසර 15 කට පමණ පසුව 2017 ජුලි මාසයේ නව කඩ කුලි තක්සේරුව මත රු.4,968,000 කට ආදායම් බිල් කිරීම් කර තිබුණත් 2018 අගෝස්තු 02 දිනැති තීරණ අංක 5.1.2 යටතේ සභා තීරණයක් මත අවලංගු කර තිබුණි. | නව තක්සේරුව අනුව කුලි මුදල් අයකල යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිති නිලධාරි විමසා නව තක්සේරුව පිළිගැනිම හා එය ක්‍රියාත්මක කිරිමට ඉදිරි තීරණ ගන්නෙමි. |

2.2.5 ත්‍රී රෝද රථ ගාස්තු අය කිරිම
--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ත්‍රී රෝද රථ නවතා තබන ස්ථාන 67 ක් ගැසට් කර තිබුණ අතර ඉන් 2018 වර්ෂයේදී සමීක්ෂණයට භාජනය කර තිබුණේ ස්ථාන 43 ක් පමණි. සමීක්ෂණයට භාජනය කරන ලද ත්‍රී රෝද රථවලින් කිසිඳු ගාස්තුවක් අය කර නොතිබුණි. | ත්‍රී රෝද රථ නවතා තබා ගැනිමේ ස්ථාන සමීක්ෂණය කර ගාස්තු අය කල යුතුවේ. | ත්‍රී රෝද රථ නැවතුම්පල ගාස්තු අය කිරිමේදී ත්‍රි විල් හිමියන් පිලිබඳ ගැටළු පවතින අතර අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරිමට කටයුතු කරමි. |

2.2.6 මුද්දර ගාස්තු
---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 ජුනි 30 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.66,122,270 ක් විය. | හිඟ මුද්දර ගාස්තු ආදායම ලබා ගැනිමට කටයුතු කල යුතුවේ. | මුද්දර ගාස්තු උපලේඛන පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට යවා ඇත. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) අතුරු ව්‍යවස්ථා** | | |
| නගර සභා පනතේ 157 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එක් කාරණාවක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | නගර සභා පනතේ සඳහන් අතුරු ව්‍යවස්ථා පනවා ගැනිමට කටයුතු කල යුතුවේ. | 2015 දෙසැම්බර් 28 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රධාන කාරණා 15 පිළිබඳ අතුරු ව්‍යවස්ථා පනවා ඇත. |
| **(ආ) ක්‍රියාකාරි සැලැස්ම** | | |
| (i) සභාව විසින් සකස් කරන ලද ක්‍රියාකාරි සැලැස්ම තුල වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් වෙන්කල පුනරාවර්තන හා ප්‍රාග්ධන පිරිවැය රු.මි.259.1ක් සඳහා අක්මුදල් සැලැස්මක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදිව කටයුතු කරමි. |
| (ii) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරි සැලැස්මෙහි ව්‍යාපෘති 15ක් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබුණත් , එම ව්‍යාපෘති කිසිවක් ඉටු නොකර රු.මි.5.4 ක පිරිවැය වූ ව්‍යාපෘති 17 ක් ක්‍රියාකාරි සැලැස්මෙන් පරිබාහිරව ක්‍රියාත්මක කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදිව කටයුතු කරමි. |
| **(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| (i) කසළ කළමනාකරණ කටයුතු සඳහා දායක වන කාර්යය මණ්ඩල වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.2,522,037 ක වියදමක් දරා තිබුණ අතර සමස්ථ කසළ කළමනාකරණ වියදම රු.40,136,037 ක් විය. එම වියදම සභාවේ සමස්ථ වරිපනම් බදු බිල් කිරිමෙන් සියයට 95 ක් විය. | කසල කළමනාකරණය සඳහා දිගු කාලින සැලැස්මක් පිළියෙල කර වියදම් අවම වන ලෙස කසල කළමනාකරණය කල යුතුවේ. | කසල බැහැර කිරිමට ස්ථානයක් සභා බල ප්‍රදේශයේ නොමැති බවත් විධිමත් කසල බැහැර කිරිමේ ක්‍රමයක් නොමැතිවීම මත පෞද්ගලික ආයතනයක් වෙත කසල බැහැර කිරිමට පවරා ඇත. |

| | | |
|---|---|---|
| (ii) 2010 වර්ෂයේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සහ සභා අරමුදල් රු.774,593 වැය කර ජීව වායු ඒකකයක් ඉදිකර තිබුණ ද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිකර ඇති ජීවවායු ඒකකය ඵලදායි ලෙස යොදවා ගැනීමට කටයුතු කල යුතුවේ. | අක්‍රිය තත්ත්වයේ පවතින ජීව වායු ඒකකය ක්‍රියාකාරි තත්වයට පත් කිරිමට රු.ලක්ෂ 10 ක වියදමක් යන අතර ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනිමට නොහැකි වේ. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| (i) 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට තිරසර සංවර්ධන ඉලක්ක ඇතුලත් කර නොතිබුණු අතර හදුනාගත් දර්ශක සඳහා සියළුම පාර්ශවයන් නියෝජනය වන දත්ත එක්රැස් කිරිමේ ක්‍රමවේදයක් හා ඒ සඳහා නිලධාරින් යෙදවීමක්ද සිදු කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු මැනිමට දර්ශක හදුනාගෙන ඒ අනුව කටයුතු කල යුතුවේ. | දිළිඳුකම පිටු දැකීම සඳහා 2020 දී වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට බලාපොරොත්තු වේ. |
| (ii) තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු කරා ළඟා වීමට අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන හඳුනා ගැනීමක් සභාව විසින් සිදු කර නොතිබුණ අතර, භෞතික සම්පත් කළමනාකරණය සඳහා ක්‍රමවේදයක් නොතිබුණි | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉදිරි කාලයේදී තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනිමට කටයුතු කරමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| (i) අනුමත කාර්ය මණ්ඩලයේ ගණකාධිකාරි තනතුර, මහජන සෞඛ්‍ය පරික්ෂක තනතුර, පුස්තකාලයාධිපති තනතුරක්, තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරක්, කළමනාකරණ සහකාර තනතුරක්, ආදායම් පරික්ෂක තනතුරු 02 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 20 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු වු තනතුර සම්පූර්ණ කර ගැනිමට කටයුතු කල යුතු වේ. | පුරප්පාඩු වු තනතුර සම්පූර්ණ කර ගැනිමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ii) සෞඛ්‍ය කම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සභාවේ සේවයේ නියුක්තව සිටියදී හඩ්සන් උද්‍යාන පවිත්‍රතා කටයුතු වෙනුවෙන් 2018 වර්ෂයේදී මසකට රු.25,200 බැගින් ගාස්තු ගෙවීමේ පදනම මත පෞද්ගලික ආයතනයකින් සේවා ලබා ගැනීම සිදු කර තිබුණි. | සේවා අවශ්‍යතාවය මත අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කල යුතු වේ. | දැනට සිටින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන නිසා වඩා ඵලදායි ලෙස සේවය ලබා ගැනිමට කටයුතු කර ඇත. |
| (ආ) සේවක ණය<br>-------------- | | |
| (i) මිය ගිය සේවකයෙකුගේ රු.102,700 ක්, සේවය හැර ගිය සේවකයින් 02 දෙදෙනෙකු රු.282,600 ක් සහ විශ්‍රාම ගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් රු.766,005 ක් වශයෙන් රු.1,151,305 ක ණය ශේෂ 2019 ජුලි 01 දින වන විට අයවිය යුතුව පැවතුණි. | කඩිනමින් හිග ණය ශේෂ අයකර ගත යුතුවේ. | අය කර ගැනිමට කටයුතු කරමි. |
| (ii) 2009 වර්ෂයට පෙර සිට පැවත එන හඳුනා නොගත් සේවක ණය ශේෂය රු.521,639 ක් විය. | ණය ශේෂයන් හඳුනා ගැනිමට කටයුතු කල යුතුවේ. | පළාත් පාලන කොමසාරිස්ගෙන් අනුමැතිය ලබා ගෙන ගිණුම් වලින් ඉවත් කිරිමට කටයුතු කරමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|
| (අ) 1993 සහ 1994 වර්ෂ වලදී ඉදි කරන ලද වර්ග අඩි 25,830 ක විශාලත්වයකින් යුතු පොදු වෙළඳ පොල සංකීර්ණ ගොඩනැගිල්ල 2016 අගෝස්තු 24 දින ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ලබා දෙන ලද වාර්තාව අනුව මෙම ගොඩනැගිල්ලෙහි කොන්ක්‍රිට් ව්‍යුහය දිරාපත් වී තිබීම හා අළුත්වැඩියා කිරිම ඵලදායි නොවීම යන හේතු මත කඩා ඉවත් කලයුතු බව අනාවරණය කර තිබුණ අතර 2019 ජුනි 15 වනවිටත් වෙළඳසැල් පවත්වාගෙන යමින් පැවතුණි. 2017 ජුලි 04 දින පැවති පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේදී ද මෙම කරුණ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියා මාර්ග වෙත යොමු වන ලෙස නියෝගය කර ඇතත් එම නියෝගය 2019 ජුනි 15 දින තෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2017 ජුලි 04 දින පැවති පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කළ යුතුවේ. | ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරිමට කටයුතු සිදු කරමින් පවතී. |

3.4 වත්කම් කළමණාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ට්‍රැක්ටර් ට්‍රේලර් 09 ක් සඳහා ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබාගෙන නොතිබුණි. | ධාවන තත්ත්වයේ පවතින සියළුම වාහන සඳහා ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබාගත යුතුවේ. | රක්ෂණ සහතික හා ආදායම් බලපත්‍ර ලබා ගැනිමට කටයුතු කරමින් පවති. |

3.5 ප්‍රසම්පාදනය

----------------

3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්මට පරිභාහිරව රු.5,425,422 ක වියදමක් යටතේ සිදු කර තිබු කර්මාන්ත 17 ක කාර්ය සාධනය මැන බැලීමේ ක්‍රම වේදයක් නොතිබුණි. | කාර්ය සාධනය මැන බැලිමේ ක්‍රමවේදයක් තිබිය යුතු වේ. | ක්‍රියාකාරි සැලැස්මට පරිභාහිරව ව්‍යාපෘති සභාව පිහිටුවිමෙන් පසු ඉදිරිපත් වු යෝජනා වලින් ප්‍රමුඛතාවය සලකා බලා ඉටු කර ඇත. |

3.5.2 සැපයීම් හා සේවා

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු.984,587 ක වියදමක් දරා 2017 දෙසැම්බර් 31 දින වෙරළ උද්‍යානයේ කොන්ක්‍රීට් මේස සමඟ හතරැස් ආකාරයේ පුටු 4 බැඟින් ස්ථාපිත කර තිබුණු අතර මෙලෙස ස්ථාපිත කල මේස 14 න් මේස 06 ක් කැඩී තිබු බව 2018 සැප්තැම්බර් 27 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදි නිරීක්ෂණය විය. | ගිවිසුම්ගත වු ආකාරයට නියමිත ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ මිලදී ගත යුතුවේ. | වෙරළ උද්‍යානයේ ස්ථාපිත කළ උපකරණ පරිහරණය කරන භාහිර පාර්ශවයන්ගේ නොසැලකිලිමත්භාවය හේතුවෙන් ස්ථාපිත කර ඇති උපකරණ ගැලවී ඇත. |